**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**ලංසු කැඳවීම**

**කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සඳහා කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීමට එම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති විසින්, යෝග්‍යතා සපිරි සුදුසුකම් ලත් ලංසු අයදුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

**කොන්දේසි**

| | |
|---|---|
| **වාහන වර්ගය** | පෙට්‍රල්/දෙමුහුන් එන්ජින් ධාරිතාවය 1600 හෝ විද්‍යුත් වාහන නම් කිලෝවොට් 80 නොයික්මවන වාහන |
| **වාහනයේ තත්වය** | 2016 වර්ෂයට පසු වර්ෂවල නිපදවූ ඉතා හොඳ ධාවන තත්වයක් සහිත |
| **කොන්ත්‍රාත් කාලය** | මාස 60 |
| **මාසික ධාවන දුර** | කිලෝමීටර් 3000 |

**සැපයුම් කරු වෙත**

| | |
|---|---|
| **තිබිය යුතු යෝග්‍යතා** | ශ්‍රී ලංකාවේ ඇති වාහන සන්නාමයන්හි වරලත් වාහන නියෝජිතයින්,<br>අවම වශයෙන් වාහන 10කට වඩා වැඩි සංචිතයක් සහිත ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි මූල්‍ය ආයතන සහ කුලී පදනම මත වාහන ලබා දෙන සමාගම් |
| **සැපයිය යුතු සේවාවන්** | වාහනයේ ක්‍රමවත් නඩත්තු, අලුත්වැඩියා කටයුතු, වාර්ෂිකව බලපත්‍ර ලබා ගැනීම, දුම් පරීක්ෂණ, පූර්ණ රක්ෂණ කටයුතු බදුකරු විසින්ම ඉටුකල යුතුය. |
| **විකල්ප වාහන සැපයීම** | කිසියම් අලුත්වැඩියා හෝ නඩත්තු කටයුත්තක් සඳහා පැය 24 කට අධික කාලයක් ගතවන්නේ නම් හෝ අදාල කටයුතු සිදුවන අවස්ථාවේ කල්බදු කරුට අවශ්‍යතාවයන් පවතින්නේ නම් එම වාහනයට සමාන වෙනත් වාහනයක් සැපයීමට බදුකරු කටයුතු කළ යුතුය. |

උනන්දුවක් දක්වන සැපයුම්කරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු 2023.06.15 දින දක්වා පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාර්යාල වේලාවන් තුළදී දුරකථන අංක 0112688146/0112684767 ඔස්සේ කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත අංක 53, දරන ලිපිනයෙහි පිහිටි ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැකි අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර 2023.05.31 දින සිට 2023.06.15 දින දක්වා කාලසීමාව හා උක්ත කාර්යාල වේලාවන් තුල ආපසු නොගෙවන රු. 3500.00 ලංසු ගාස්තුව ගෙවා ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කර ඇති අංග සම්පූර්ණ ලංසු ලේඛන කට්ටල මිලදී ගත හැක. අදාල ලංසු ගාස්තුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මුදල් අයකැමි වෙත මුදලින් පමණක් ගෙවිය යුතුය. එමෙන්ම **ජාතික කෞතුකාගර වෙබ් අඩවියෙන් බාගත කර ඉදිරිපත් කරන ලංසු ලේඛනද වලංගු ලේඛන සේ සැලකේ.**

නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු පත්‍රිකා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, අංක 53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට 2023.06.16 දින ප.ව. 2.30 ට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ එම දෙපාර්තමේන්තුවෙහි ගිණුම් අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කල යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේදී ලංසු කරුවන් හෝ ඔවුන්ගේ අවසරලත් නියෝජිතයින් හමුවෙහි ලංසු විවෘත කරනු ඇත.

**සභාපති**

**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

**අංක 53, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07**